# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) - 2023/2024

## PSC - 1101 - දේශපාලන විද්‍යාව: හැඳින්වීමක්

**කාලය : පැය දෙකයි (02)**

ප්‍රශ්න **හතරකට ( 04 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **පහළොවකි (15).**

---

01. "දේශපාලනය සෑම තැනකම පවතී". ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? සමකාලීන නිදසුන් සමඟ ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

02. දේශපාලන බලය වෙනස් සන්දර්භයන් තුළ වෙනස් ආකෘතීන් අත්පත් කරගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

03. සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට කාර්මික විප්ලවය දක්වා බටහිර සමාජයන් තුළ දේශපාලනය පිළිබඳ හැදෑරීම් විකාශනය වූයේ කෙසේදැයි සංක්ෂිප්තව විස්තර කරන්න.

04. **එක්කෝ,**

    i. දේශපාලන විද්‍යා පර්යේෂණවල සාම්ප්‍රදායික සහ නූතන ප්‍රවේශයන් අතර පවතින වෙනස්කම් හඳුන්වා දෙන්න.

    **නැතහොත්,**

    ii. දේශපාලනය අධ්‍යයනය කිරීමේදී චර්යාවාදී ප්‍රවේශයේ වාසි අවාසි මොනවාද?

05. දේශපාලන විද්‍යා ශික්ෂණය විද්‍යාවක්ද කලාවක්ද යන්න සාකච්ඡා කරන්න.

(ඈ:පි:බ)

06. දේශපාලනය කෙරෙහි සමාජ ව්‍යාපාරවල බලපෑම අදාළ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

07. ඔබ කැමති ප්‍රධාන දේශපාලන දෘෂ්ටිවාද දෙකක් අතරැති සමානකම් සහ වෙනස්කම් දක්වන්න.

08. පහත සඳහන් තේමා **තුනක් (03)** පිළිබඳ සටහන් ලියන්න

i. දෛනික දේශපාලනය
ii. සමාජ සම්මුතිය පිළිබඳ ජෝන් ලොක්ගේ සංකල්පය
iii. කැමැත්ත මගින් පාලනය කිරීම
iv. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශය
v. දේශපාලන ආයතන
vi. ශ්‍රී ලංකාවේ 2022 වසරේ පැවති ජනතා අරගලය

**************************************************